DOI : 10.31357/fhssmst.2008.00663

# පුද්ගල ශරීරයට එරෙහි අපරාධවල ප්‍රවණතාව පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

# (1984 සිට 2003 දක්වා කුලියාපිටිය පොලිස් අධිකාරි කොට්ඨාසය ඇසුරින්)

දසනායක පතිරන්නැහැලාගේ පියදාස දසනායක

ලියාපදිංචි අංකය : GS/SS/1581/2002

02 JUL 2008

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

අපරාධ විද්‍යාව විෂයය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්ලිව්. එම්. ධනපාල මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

දිනය 2008-06-28

අපේක්ෂකයාගේ අත්සන

## උපදේශකගේ නිර්දේශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

2008/6/28 ..................................

දිනය

..................................

උපදේශකගේ අත්සන

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

02 JUL 2008

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

# පටුන


| | | පිටු අංක | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| **පළමුවන පරිච්ඡේදය** | | | |
| 1.1 | හැඳින්වීම | 1 | 21 |
| 1.2 | පර්යේෂණ ගැටළුව | 21 | - |
| 1.3 | අරමුණු | 22 | - |
| 1.4 | පර්යේෂණ ක්‍රමවේදය | 22 | - |
| 1.4.1 | ක්ෂෙත්‍රය හා නියැදිය | 22 | 24 |
| 1.4.2 | දත්ත රැස්කිරීමේ ශිල්පක්‍රම | 24 | 25 |
| 1.4.2.1 | ප්‍රශ්නාවලි ක්‍රමය | 25 | 26 |
| 1.4.2.2 | සම්මුඛ සාකච්ඡා | 26 | 27 |
| 1.4.2.3 | ආවෘත සම්මුඛ සාකච්ඡා | 27 | 28 |
| 1.4.2.4 | නිරීක්ෂණය | 28 | 29 |
| 1.4.2.5 | සිද්ධි අධ්‍යයනය | 29 | - |
| 1.5 | ද්විතීයික මූලාශ්‍ර | 29 | 30 |
| 1.6 | දත්ත විශ්ලේෂණය | 30 | - |
| 1.7 | පර්යේෂණ සීමාවන් හා ගැටළු | 30 | 33 |
| 1.8 | දළ සැලැස්ම | 33 | 34 |
| **දෙවන පරිච්ඡේදය** | | | |
| 2.1 | පොලිස් පරිපාලන රටාව | 35 | 40 |
| 2.2 | පිහිටීම හා භූගෝලීය ලක්ෂණ | 40 | |
| 2.3 | ආර්ථික කටයුතු | 41 | - |
| 2.4 | දේශපාලන ව්‍යුහය හා පරිපාලන රටාව | 42 | - |
| 2.5 | ජනගහනය | 42 | 47 |

තුන්වන පරිච්ඡේදය


| | | | |
|---|---|---|---|
| 3.1 | පර්යේෂණ ක්ෂෙත්‍රය තුළ පුද්ගලයාට එරෙහි අපරාධ රටාව | 48 | 82 |
| 3.2 | කුලියාපිටිය කොට්ඨාසයේ 1984 සිට 2003 දක්වා දශක දෙක තුළ පුද්ගල ශරීරයට එරෙහි අපරාධ ප්‍රවණතාව | 82 | 103 |
| තුන්වන පරිච්ඡේදය සමාලෝචනය | | 104 | 106 |


හතරවන පරිච්ඡේදය

පුද්ගල ශරීරයට එරෙහි අපරාධ නිසා කොට්ඨාසයේ පවුල් ඒකක වලට සහ ජනජීවිතයට ඇති කරන බලපෑම


| | | | |
|---|---|---|---|
| 4.1 | ආර්ථික අපහසුතා | 108 | 113 |
| 4.2 | දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාලවීම | 113 | 114 |
| 4.3 | ස්වාමි පුරුෂයා හා බිරිඳ වෙන්වීම | 114 | 116 |
| 4.4 | ආබාධිතයන් බවට පත්වීම | 116 | 118 |
| 4.5 | පවුලේ සමාජ මට්ටම පහළ බැසීම | 118 | 120 |
| 4.6 | බියෙන් සැකයෙන් ජීවත් වීටම සිදුවීම | 120 | 121 |
| 4.7 | සියදිවි හානි කර ගැනීම හා වෙනත් ආකාරයෙන් මිය යාම | 121 | 122 |
| 4.8 | නීති විරෝධී මත්පැන්, මත්කුඩු හා වෙනත් දූරාචාර වලට නැඹුරුවීම. | 122 | 124 |
| හතරවන පරිච්ඡේදය සමාලෝචනය | | 124 | 126 |


පස්වන පරිච්ඡේදය

පුද්ගල ශරීරයට එරෙහි අපරාධ කෙරෙහි බලපා ඇති ඇති හේතු සාධක


| | | | |
|---|---|---|---|
| 5.1 | බීමත්කම | 127 | 132 |
| 5.2 | පවුල් ආරවුල් හා වෙනත් ආරවුල් | 132 | 134 |
| 5.3 | බිඳුණු පවුල් | 134 | 136 |
| 5.4 | නූගත්කම | 136 | 137 |
| 5.5 | මව, පියා හෝ විදේශ රැකියාවලට යාම | 138 | 141 |
| 5.6 | නිවසේ තනි වී සිටීම | 141 | 142 |

| | | | |
|---|---|---|---|
| 5.7 | ත්‍රිවිධ හමුදාවෙන් පැන ගිය සෙබළුන් | 142 | 143 |
| 5.8 | මත්ද්‍රව්‍ය භාවිතය | 144 | 145 |
| 5.9 | අපරාධ කරුවන් යැයි නම් පටබැදීම | 145 | 146 |
| 5.10 | 1988-1989 වර්ෂවල පැවති භීෂණකාරී පසුබිම | 146 | 149 |
| 5.11 | දේශපාලන ප්‍රචණ්ඩත්වය | 149 | 150 |
| 5.12 | සුළු ආරවුල් | 151 | 153 |
| පස්වන පරිච්ඡේදය සමාලෝචනය | | 151 | 153 |

**සයවන පරිච්ඡේදය**

| | | | |
|---|---|---|---|
| සමාලෝචනය, නිගමන හා යෝජනා | | 154 | 166 |
| විමර්ශනය කරන ලද පුස්තක නාමාවලිය | | 167 | 174 |

# වගු හා ප්‍රස්තාර සටහන

පිටුව

වගු සටහන


| | | |
|---|---|---|
| 2.1 | කුලියාපිටිය කොට්ඨාසයේ ජනගහනය 1984-2003 දක්වා | 43 |
| 2.2 | 2001 ජන සංගණනයට අනුව ජාතීන් අනුව ජනගහනය | 44 |
| 2.3 | 2001 ජන සංගණනයට අනුරූපව ආගම් අනුව ජනගහනය | 45 |
| 2.4 | 2001 ජන සංගණනයට අනුව ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනය | 45 |
| 2.5 | 2001 ජන සංගණනයට අනුව ග්‍රාමීය, නාගරික සහ වතු අනුව ජනගහනය | 46 |
| 2.6 | 2001 ජන සංගණනයට අනුව කුලියාපිටිය කොට්ඨාසයේ අධ්‍යාපන මට්ටම | 47 |
| 3.1 | ශ්‍රී ලංකාව තුළ සිදුව ඇති පුද්ගල ශරීරයට එරෙහි අපරාධ 1984 සිට 2000 වසර දක්වා | 50 |
| 3.2 | ශ්‍රී ලංකාව තුළ සිදුව ඇති දේපලවලට එරෙහි අපරාධ 1984 සිට 2000 වසර දක්වා | 51 |
| 3.1.1 | ශ්‍රී ලංකාව තුළ සිදුව ඇති පුද්ගල ශරීරයට එරෙහි අපරාධ 2001 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා පොලිස්පති චක්‍රලේඛ 1540/2000 පරිදි සංශෝධනයට අනුව | 52 |
| 3.2.1 | ශ්‍රී ලංකාව තුළ සිදුවී ඇති දේපල වලට එරෙහි අපරාධ 2001 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා පොලිස්පති චක්‍රලේඛ 1540/2000 පරිදි සංශෝධනයට අනුව | 53 |
| 3.3 | කුලියාපිටිය පොලිස් අධිකාරි කොට්ඨාසය තුළ සිදුවී ඇති පුද්ගල ශරීරයට එරෙහි අපරාධ 1984 වර්ෂයේ සිට 2000 වසර දක්වා | 54 |
| 3.4 | කුලියාපිටිය පොලිස් අධිකාරි කොට්ඨාසයේ සිදුවී ඇති දේපල වලට එරෙහි අපරාධ 1984 සිට 2000 වසර දක්වා | 55 |
| 3.3.1 | කුලියාපිටිය පොලිස් අධිකාරි කොට්ඨාසයේ සිදුවී ඇති පුද්ගල ශරීරයට එරෙහි අපරාධ 2001 වර්ෂයේ සිට 2003 දක්වා පොලිස්පති චක්‍රලේඛ 1540/2000 පරිදි සංශෝධනයට අනුව | 56 |
| 3.4.1 | කුලියාපිටිය පොලිස් අධිකාරි කොට්ඨාසයේ සිදුවී ඇති දේපල වලට එරෙහි 2001 වර්ෂය සිට 2003 වර්ෂය දක්වා | 57 |
| 3.5 | සමස්ත ශ්‍රී ලංකාව තුළ සිදුවී ඇති පුද්ගල ශරීරයට එරෙහි අපරාධ 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා | 59 |

| | | |
|---|---|---|
| 3.6 | ශ්‍රී ලංකාවේ අපරාධ ප්‍රතිශතය 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා | 60 |
| 3.7 | කුලියාපිටිය කොට්ඨාසයේ පුද්ගල ශරීරයට එරෙහි අපරාධ රටාව සහ එහි ප්‍රතිශතය. 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා | 62 |
| 3.8 | කුලියාපිටිය කොට්ඨාසයේ පුද්ගල ශරීරයට එරෙහි අපරාධ රටාව, ව්‍යුහය හා එහි ප්‍රතිශතය 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා | 64 |
| 3.9 | කුලියාපිටිය කොට්ඨාසයේ පිහි ආදී කැපෙන උපකරණ වලින් තුවාල සිදුකිරීම යන අපරාධය සඳහා භාවිතා කර ඇති ආයුධ සහ උපකරණ 1984 වර්ෂය සිට 2003 වර්ෂය දක්වා | 68 |
| 3.10 | කුලියාපිටිය කොට්ඨාසයේ බරපතල තුවාල සිදු කිරීම යන අපරාධය සඳහා ක්‍රියාත්මක කර ඇති උපක්‍රම. 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා | 70 |
| 3.11 | කුලියාපිටිය කොට්ඨාසයේ මනුෂ්‍ය ඝාතනය සඳහා යොදාගෙන ඇති උපක්‍රම 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා | 74 |
| 3.12 | කුලියාපිටිය කොට්ඨාසයේ අපහරණය හා පැහැරගෙන යෑම යන අපරාධය සිදුවී ඇති රටාව 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා | 77 |
| 3.13 | කුලියාපිටිය කොට්ඨාසයේ ස්ත්‍රී දූෂණය සිදුවී ඇති රටාව 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා | 79 |
| 3.14 | කුලියාපිටිය කොට්ඨාසයේ මනුෂ්‍ය ඝාතන අනුපාතය 1984 සිට 2003 දක්වා | 84 |
| 3.15 | කුලියාපිටිය කොට්ඨාසයේ පිහි ආදී කැපෙන උපකරණ වලින් තුවාල සිදු කිරීමේ අනුපාතය 1984 සිට 2003 දක්වා | 88 |
| 3.16 | කුලියාපිටිය කොට්ඨාසයේ බරපතල තුවාල සිදුකිරීම අපරාධ අනුපාතය 1984 සිට 2003 දක්වා | 92 |
| 3.17 | කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසයේ ස්ත්‍රී දූෂණ අනුපාතය 1984 සිට 2003 දක්වා | 95 |
| 3.18 | කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසය තුළ අපහරණය හා පැහැරගෙන යෑම අපරාධ අනුපාතය 1984 සිට 2003 දක්වා | 98 |
| 3.19 | කුලියාපිටිය කොට්ඨාසයේ මිනීමැරුමට තැත් කිරීම අපරාධ අනුපාතය 1984 සිට 2003 දක්වා | 101 |

4.1 කුලියාපිටිය කොට්ඨාසයේ මනුෂ්‍ය ඝාතනයට ගොදුරුවූවන් සහ විත්තිකරුවන් නියුක්ත වී සිටි රැකියාවන් 1984 සිට 2003 දක්වා 109

4.2 කුලියාපිටිය කොට්ඨාසයේ පුද්ගල ශරීරයට එරෙහිව සිදුකර ඇති අපරාධවලට ගොදුරුවූවන් සහ චූදිතයන් නියුක්තව සිටි රැකියාවන් 1984 සිට 2003 දක්වා 111

4.3 කුලියාපිටිය කොට්ඨාසයේ පුද්ගල ශරීරයට එරෙහි අපරාධ නිසා ආබාධිත තත්ත්වයට පත්ව ඇති සංඛ්‍යාව 1984 සිට 2003 දක්වා 117

5.1 කුලියාපිටිය කොට්ඨාසයේ පුද්ගල ශරීරයට එරෙහි අපරාධවලට ගොදුරුවන අවස්ථාවලදී සහ එම අපරාධ සිදු කිරීමේදී මත්පැන් පානය කර සිටි පුද්ගලයන් 131

5.2 කුලියාපිටිය කොට්ඨාසයේ 1988-1989 භීෂණ කාල පරිච්ඡේදය තුළ වාර්තා වී ඇති පුද්ගල ශරීරයට එරෙහි අපරාධ 148

ප්‍රස්තාර සටහන

3.1 කුලියාපිටිය පොලිස් කොට්ඨාශය පුද්ගල ශරීරයට එරෙහි අපරාධ රටාව 1984-2003 66

3.2 කුලියාපිටිය කොට්ඨාසයේ මනුෂ්‍ය ඝාතන අනුපාතය 1984 සිට 2003 වර්ෂය දක්වා 87

3.3 කුලියාපිටිය කොට්ඨාසයේ පිහි ආදී කැපෙන උපකරණවලින් තුවාල සිදු කිරීමේ අනුපාතය 1984 වර්ෂයේ සිට 2003 දක්වා 89

3.4 කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසයේ බරපතල තුවාල සිදුකිරීමේ අනුපාතය 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා 93

3.5 කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසයේ ස්ත්‍රී දූෂණ සිදු කිරීමේ අනුපාතය 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා 96

3.6 කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසයේ අපහරණය හා පැහැරගෙන යෑමේ අනුපාතය 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා 99

3.7 කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසයේ මිනී මැරුමට තැත් කිරීම අපරාධ අනුපාතය 1984 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා 102

# කෘතඥ වදන හා ස්තුතිය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය වෙනුවෙන් සම්පාදනය කිරීමට නියමිත පර්යේෂණ නිබන්ධය වශයෙන් "පුද්ගල ශරීරයට එරෙහි අපරාධවල ප්‍රවණතාව පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක් (1984 සිට 2003 දක්වා කුලියාපිටිය පොලිස් අධිකාරි කොට්ඨාසය ඇසුරින්") යන මාතෘකාව මා විසින් තෝරා ගෙන ඇත.

ශ්‍රී ලංකාව තුළ සිදුවෙමින් පවතින අපරාධ පිළිබඳව පොදුවේ සහ පොලිසිය හා බන්ධනාගාරය සම්බන්ධයෙන් අපරාධ විද්‍යාත්මක පර්යේෂණ කීපයක් විද්වතුන් විසින් සිදු කර ඇති නමුදු පුද්ගල ශරීරයට එරෙහි අපරාධ ප්‍රවණතාව පිළිබඳ වෙනම විෂයන් ලෙස සලකා සිදු කෙරුණ පර්යේෂණ ගැන කිසිදු තොරතුරක් අනාවරණය කර ගැනීමට නොහැකි වූ බව සඳහන් කළ යුතුය.

ශ්‍රී ලංකාවේ සමාජ සන්දර්භය තුළ අපරාධ ප්‍රවණතා බරපතල ලෙස වර්ධනය වෙමින් පවතින යුගයක අපි පසු වන්නෙමු. එමෙන්ම මනුෂ්‍ය ඝාතනය, ස්ත්‍රී දූෂණය, පිහිආදී කැපෙන උපකරණවලින් තුවාල සිදු කිරීම, බරපතල තුවාල සිදු කිරීම, ළමුන්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම, යනාදි පුද්ගල ශරීරයට එරෙහි අපරාධ නිර්මාණය වීම කෙරෙහි විවිධ උගතුන් මෙන්ම ජන මාධ්‍ය මගින්ද, විශේෂ අවධානයක් යොමුකර තිබීම සුලභ කරුණකි.

විශේෂයෙන් මනුෂ්‍ය ඝාතනය, ස්ත්‍රී දූෂණය යන පුද්ගල ශරීරයට එරෙහි අපරාධ නිසා නිර්මාණය වී ඇති සමාජ හානි සහ සමාජ ගැටළු ඉහළ මට්ටමක පවතින බව ද කිව යුතුය. මෙවැනි පසුබිමක් යටතේ පුද්ගල ශරීරයට එරෙහි අපරාධ ප්‍රවණතාව පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකර දැනුම ප්‍රචලිත කිරීම කාලීන අවශ්‍යතාවයක් යැයි අදහස් කළෙමි.

විද්වතුන් හා ජනමාධ්‍ය මගින් පෙන්වා දෙන පරිදි සංඛ්‍යාත්මක වශයෙන් වැඩි බවක් දැකිය හැකි කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසයේ 1984 සිට 2003 දක්වා සිදුකර ඇති පුද්ගල ශරීරයට එරෙහි අපරාධ අදාළ වර්ෂවල ජනගහනයට සාපේක්ෂව කවර විපර්යාසයකට ලක්ව ඇත්දැයි මෙහිදී ගවේෂණය කිරීමත් සිදුකර ඇත.

එමෙන්ම අදාළ කාල පරිච්ඡේද තුළ කුලියාපිටිය කොට්ඨාසයේ පුද්ගල ශරීරයට එරෙහි අපරාධ නිසා ජන ජීවිතයට සිදුවී ඇති අයහපත් බලපෑම් සහ මෙම අපරාධ නිර්මාණය වීමට පසුබිම් වූ කරුණු සම්බන්ධයෙන් ද මෙහිදී විමසීමක් සිදු කර ඇති බව කිව යුතුය.

මෙම නිබන්ධ කටයුත්තෙහි උපදේශක ලෙස කටයුතු කරමින් මා හට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් නිවැරදි මඟ පෙන්වීමක් සිදුකළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල විජේසිංහ මහතාට මාගේ කෘතඥ පූර්වක ප්‍රණාමය පුද කරමි.

එමෙන්ම මෙම පාඨමාලාව සම්බන්ධීකරණය කරමින් විවිධ අන්දමින් මඟපෙන්වීම් හා උපදෙස් ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ අධ්‍යයනාංශ ප්‍රධානි ප්‍රණීත් අබේසුන්දර මැතිතුමාටත්, හිටපු අධ්‍යයනාංශ ප්‍රධානි ස්වර්ණලතා පෙරේරා මැතිණියටත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයේ ලේඛකාධිකාරී තුමියට සහ නියෝජ්‍ය ලේඛකාධිකාරී තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

අවශ්‍ය උපදෙස් ලබා දෙමින් මා දිරිමත් කළ මහාචාර්ය ටෙනිසන් පෙරේරා මැතිතුමාටත්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදයකුමාර අමරසිංහ මැතිතුමාටත්, ඉතා කැපවීමකින් යුතුව දේශන පවත්වමින් මා හට දැනුම් සම්භාරයන් ලබා දුන් සියළුම දේශක මැතිතුමන්ලාටත් මාගේ කෘතඥතාව පුද කරමි.

මෙම නිබන්ධ කටයුත්ත සඳහා නන් අයුරින් සහයෝගය ලබා දුන් කුලියාපිටිය කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලක්ෂ්මන් බණ්ඩාර සහ පොලිස් අධිකාරී කුලියාපිටිය I, බී.ඒ.ඩී.එන්.ආර්. පත්මසිරි යන මැතිතුමන්ලාටත්, අවශ්‍ය දත්ත එක්රැස් කිරීම සඳහා කැප වීමකින් යුතුව කටයුතු කළ කොට්ඨාසයේ සියළුම ප්‍රජා සම්බන්ධතා නිලධාරී මහතුන්ටත්, ග්‍රාමසේවා නිලධාරී මහතුන්ටත්, දත්ත දායකයන් ලෙස කටයුතු කළ සිවිල් ප්‍රජාවටත්, මෙම නිබන්ධය ආරම්භයේ සිට අවසානය දක්වා මා දිරි ගන්වමින් කැපවීමකින් යුතුව සහයෝගය ලබා දුන් මගේ දයාබර බිරිඳ සෝමලතා දසනායක මහත්මියටත්, අරුණ සනත් මුණසිංහ, කස්තුරි ගංගානාත් මුනසිංහ යන පුතුන්ටත් මෙම නිබන්ධය පරිගණක ගත කර පිටපත් ලබා දුන් නාරම්මල ''අනුර ග්‍රැෆික්ස්'' ආයතනයටත්, ගංගොඩවිල, නුගේගොඩ, ''සැණික්ටා කොමියුනිකේෂන්'' ආයතනයටත්, මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පිරිනමමි.

දිනය 2008.06.28

ඩී.පී. පියදාස දසනායක

මැල්ලගස් පිටිය

ගිරිඋල්ල.

## පුද්ගල ශරීරයට එරෙහි අපරාධවල ප්‍රවණතාව පිළිබඳ

## අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

## (1984 සිට 2003 දක්වා කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසය ඇසුරින්)

ඩී.පී. පියදාස දසනායක

### නිබන්ධ සාරාංශය

පර්යේෂණ ක්ෂෙත්‍රය ලෙස කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසය තෝරා ගෙන ඇත. සරල සසම්භාවී නියදියට අනුව ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකච්ඡා, සහභාගි නිරීක්ෂණය, නිරීක්ෂණය හා සිද්ධි අධ්‍යයනය යන ප්‍රාථමික මූලාශ්‍ර ද, පොත් පත් ලේඛන යන ද්විතියික මූලාශ්‍ර ද, යන ක්‍රම වේදයන් මෙම පර්යේෂණය සඳහා උපයෝගී කර ගතිමි.

මෙම අධ්‍යයනයට අනුව 1984 සිට 2003 දක්වා දශක දෙක තුළ කුලියාපිටිය පොලිස් අධිකාරී කොට්ඨාසයේ සිදු වී ඇති පුද්ගල ශරීරයට එරෙහි අපරාධ අතුරින් මනුෂ්‍ය ඝාතනය, ස්ත්‍රී දූෂණය, අස්වාභාවික වැරදි, යන අපරාධවල ප්‍රවණතාව වැඩි වී ඇති බවට ද පිහි ආදී කැපෙන උපකරණ වලින් තුවාල සිදු කිරීම, බරපතල තුවාල සිදුකිරීම, අපහරණය හා පැහැර ගෙනයාම, මිනීමැරීමට තැත් කිරීම, යන අපරාධ ප්‍රවණතාව අඩු වී ඇති බවටද කරුණු අනාවරණය විය. සමස්තයක් වශයෙන් සලකා බලන විට කුලියාපිටිය කොට්ඨාසයේ අදාළ කාල සීමාව තුළ පුද්ගල ශරීරයට එරෙහි අපරාධවල ප්‍රවණතාව පහළ බැසීමක් සිදු වී ඇත.

මනුෂ්‍ය ඝාතනය, ස්ත්‍රී දූෂණය, අස්වාභාවික වැරදි යන අපරාධ ප්‍රවණතාව ඉහළ නැගීම කෙරෙහි බීමත්කම, මව, පියා හෝ දෙදෙනාම විදේශ රැකියාවලට යාම, නිවසේ තනි වී සිටීම, ත්‍රිවිධ හමුදාවෙන් පැන ගිය සෙබළුන්, නූගත්කම, 1988-1989 වර්ෂවල පැවති

භීෂණකාරී පසුබිම යන සාධක විශේෂයෙන් ඉවහල් වී ඇත. බරපතල තුවාල සිදු කිරීම, අපහරණය හා පැහැර ගෙන යාම, මිනී මැරුමට තැත් කිරීම, යන අපරාධ ප්‍රවණතාව අඩු වීම කෙරෙහි මෙම අපරාධ සම්බන්ධයෙන් පොලිසිය මගින් ජනතාව දැනුවත් කිරීම හා නීතිය ක්‍රියාත්මක කිරීම, වෙනස් වන සමාජ රටාව, 1988-1989 පැවති භීෂණකාරී තත්වය මැඩ පැවැත්වීම යන හේතු සාධක ඉවහල් වී ඇති බව පැහැදිලි විය.

එමෙන්ම අදාළ කාල පරිච්ඡේදය තුළ කොට්ඨාසයේ පුද්ගල ශරීරයට එරෙහි අපරාධ නිසා ආර්ථික අපහසුතා, දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කඩාකප්පල්වීම, ස්වාමියා පුරුෂයා හා බිරිඳ වෙන්වීම, ආබාධිතයන් බවට පත්වීම, පවුලේ සමාජ මට්ටම පහත බැසීම, බියෙන් හා සැකයෙන් යුතුව ජීවත්වීමට සිදුවීම, සියදිවි නසා ගැනීම හා වෙනත් ආකාරයේ මිය යාම නීති විරෝධී මත්පැන්, මත්කුඩු සහ වෙනත් දුරාචාර වලට නැඹුරු වීම යන සමාජ ගැටලු නිර්මාණය වී ඇත.

# පළමුවන පරිච්ඡේදය

# හැඳින්වීම සහ ක්‍රමවේදය

අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය වෙනුවෙන් සම්පාදනය කිරීමට නියමිත පර්යේෂණ නිබන්ධය සඳහා මා විසින් ''පුද්ගල ශරීරයට එරෙහි අපරාධවල ප්‍රවණතාව පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්'' (1984 සිට 2003 දක්වා කුලියාපිටිය පොලිස් අධිකාරි කොට්ඨාසය ඇසුරින්) යන මාතෘකාව තෝරා ගනු ලැබ ඇත. මෙම මාතෘකාව යටතේ පළමුවන පරිච්ඡේදය තුළින් මාතෘකාව හැඳින්වීම, පර්යේෂණ ගැටළුව, අරමුණු සහ උපයෝගී කරගන්නා ලද ක්‍රමවේදය පිළිබඳ විවරණයක් සිදුකෙරේ.

## 1.1 හැඳින්වීම (Introduction)

මෙම අධ්‍යයනය වෙනුවෙන් ඉහත සඳහන් කළ ආකාරයේ මාතෘකාවක් තෝරා ගැනීමට හේතු සාධක වූ කරුණු සම්බන්ධයෙන් විමසීමක් කිරීම සුදුසු යයි ප්‍රථමයෙන්ම අදහස් කළෙමි. ශ්‍රී ලංකාවේ අපරාධ සම්බන්ධයෙන් පසුගිය කාලවකවානුව තුළ සිදුකර ඇති පර්යේෂණ ග්‍රන්ථ මොනවාදැයි මෙහිදී මම අධ්‍යයනයකට ලක් කළෙමි. ඉහත අධ්‍යයනයට අනුව ඒ.ආර්.පී.සී. උදය කුමාර විසින් රචිත ''කෙටි කාලීන සිරදඬුවම් සඳහා නියම වූ වරදකරුවන් ප්‍රජාසේවයට යොමු කිරීම පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනය'' (කොළඹ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ප්‍රජා පාදක විශෝධන ව්‍යාපෘතිය ඇසුරින්), ඩී.එම්. සුගතදාස විසින් රචිත ''හෙරොයින් මත්ලෝලී ප්‍රතිකාර හා පුනරුත්තාපනය පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්'', කිංස්ලි වික්‍රමසූරිය විසින් ලියන ලද "Policing Sri Lanka Towards A new straling" යන කෘතිය සහ ජී.ඒ. ලෙස්ලි ගාමිණී ගේ ''ශ්‍රී ලංකාවේ සිදුවන වෘත්තිමය අපරාධයන්හි නෛතික හා සමාජයමය පසුබිම (රේගුව ආශ්‍රිතව සිදුකෙරෙන අපරාධ පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්)'' යන අපරාධ විද්‍යාත්මක පර්යේෂණ නිබන්ධ හඳුනාගත හැකි විය.